Page 8 SEPTEMBER 2009 .qxd 08/09/2009 15:41 Page 1



## කවි කොළය



# මිනීමරු පොලීසිය!

පසුගිය දෙමළ කොටි සංහාරයෙදි රටේ
රණ විරුවනැයි ගහගත් හංවඩුව පිටේ
ලංකා පොලිසියෙ බිහිසුණු මකර කටේ
ගිනි දළු මතුව එයි දිවයින හතර වටේ

අසරණයාට රැකවරණය සල සන්ට
පොලිසිය ඇති කළේ නීතිය රැක දෙන්ට
අද පොලිසියෙන් පණ බේරාගෙන ඉන්ට
සිදුවී තිබේ ලංකාවේ මිනි සුන්ට

වරදක් කළත් නොකළත් පොලිසියට මෙකී
කිසිවෙකු ගියොත් යන විට හිරු එළිය මැකී
ආපසු ගෙදර යන එක නම් නොවිය හැකී
කරුණකි ! ඉතින් ආවොත් මහ පුදුම යකී

අසරණ තරුණයන් දෙදෙනෙකු අඟුලා නේ
කුදලා පොලිසියට ගෙන ගොස් අවසා නේ
මේ අය කෙරුව ජඩ වැඩ රට දුටුවා නේ
බලු කප්ජට ගියා පොලිසියෙ අබිමා නේ

ඇල්ලූ විටදි පාතාලයෙ සිටිය එකා
ඌ ගෙන ගොසින් කැලයට ලනු පිණිස මකා
සඟවා තැබූ අවි පෙන්වන විටම කොකා
ගස්සයි ! පොලිසියෙ තරු පටි ගහපු යකා

තව එක් පුතෙක් පොලිසියෙ ලොක්කෙකුගෙ වෙන
සිසුවෙකු බලෙන් අල්ලා ගොස් පැහැර ගෙන
සිය මව සමග එක් වී හිස පොළවෙ ඇන
නැටුවා නැටිල්ලක් හදවත සසල වන

පාතාලයට, මිනිමරුවන් හට දරුණු
දඬුවම් කරන්නට මේ ලෙස ඉඩ ඇරුණු
නීතිය කුමට? එය කඩ මල්ලකි ඉරුණු
විමසිය යුතුයි මේ ගැන ගැඹුරට කරුණු

මේ තරුණයා පාතාලයෙ කෙනෙකි කියා
පොලිසිය බලෙන් කට උත්තර රැගෙන ලියා
ගන්නට හැදූ පුවතක් ගැන පළව ගියා
අති බිහිසුණුය. අද පොලිසිය නමැති නයා

පොඩි කොස්සාගෙ සිට
ඉහළම පොලිස් පතී
මහ විකටයන් වී
මුළු රට හිනස් සතී
පොලිසිය කෙරෙන්
මහ ජනයා දුරස් වෙතී
ඇස් ඇර බලව්!
පාලකයනි දෙඇස් ඇතී



♦ **තලන්ගම ජයසිංහ**
**Sri Lanka**

## 50 වන බණ්ඩාරනායක සමරු දිනය

# සැබෑ පොදු ජන නායකයා



**ශ්‍රී** ලංකාවේ සිව්වැනි අග්‍රාමාත්‍ය ලෙස ජන සම්භාවනාවට පත් ගරු එස්. ඩබ්ලිව් ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන් සාහසිකයෙකුගේ වෙඩි පහරට ලක්ව අව සන් හුස්ම හෙළා මේ මස 26 වෙනි දිනට වසර 50 ක් සම්පූර්ණ වෙයි. යටත් විජිත පාලන යුගයේ සිට ජනරජ යුගය දක්වාවූ ශත වර්ෂ පහක පමණ කාලය තුළ ශ්‍රී ලංකාවේ බිහිවූ නායක යන් අතුරෙන් බණ්ඩාර නායක මහතා තරම් පොදු ජනතාවගේ හද බැඳගත් නායකයෙකු නැති තරම් ය. අවුරුදු තුනහමාරක තරම් කෙටි කාලයක් රාජ්‍ය බලයෙහි සිටි එතුමා එයට වඩා දීර්ඝ කාලයක් බලවත්ව සිටි ඇත්තන්ද අභිබවා පොදු ජනතා හදට සමීප වූයේ කෙසේද යන්න සලකා බැලීම වටී.

ඉතා ධනවත් පවුලක ඉපිද එංගලන්තයේ ඔක්ස්පර්ඩ් විශ්ව විද්‍යාලයේ දීප්තිමත් අධ්‍යාපනයක් ලබා ශ්‍රීලංකාවට පැමිණි බණ්ඩාර නායක තරුණයා කෙටි කාලයක් කොළඹ නීතිඥයෙකු ලෙස වැඩ කළේය. ඔහු කොළඹ නගර සභා මැතිවරණයට ඉදිරිපත්ව එවක මහා දේශපාලන බලවතෙකුව සිටි කම්කරු නායක ගුණසිංහ මහතා පරාජයට පත් කළේ මුළු ලංකාවම විස්මයට පත්කරවමිනි.

ඉන්පසු 1931 සිට 1947 දක්වා රාජ්‍ය මන්ත්‍රණ සභාවේත් 1947 සිට නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේත් ඇමතිකම් දැරූ බණ්ඩාරනායක මහතා ඒ සියළු පදවි අත්හරිමින් 1951 දී ජනතාව අතරට පැමිණ පස් වසරක ඇවෑමෙන් ශ්‍රීලංකාවේ අග්‍රාමාත්‍ය පදවියට ද පත්වි ය.

" ප්‍රජාතන්ත්‍රවාදය සාර්ථකව ක්‍රියාත්මක වීමට නම් ආණ්ඩුවක් පිහිටුවන්නට සමත් බලසම්පන්න පක්ෂ දෙකක් හෝ වැඩි ගණනක් රටක තිබිය යුතුයි. මහජන මතයට එකඟ ප්‍රතිපත්තියකට වැඩි කැමැත්ත ලැබී කලින් කලට ආණ්ඩු පිහිටුවීමට ඉඩ සැළසෙන අයිතිවාසිකම් මහජනයාට පවරා දීම එහි ප්‍රධාන ලක්ෂණයයි. එසේ වූ විට සෑම පක්ෂයක්ම මහජන මතය අනුව තම ප්‍රතිපත්ති හැඩ ගස්වා ගන්නට උත්සාහ දරනවා ඇත." මේ එදා බණ්ඩාරනායක මහතා පැවසූ අදහසකි. ඒ මහතා එදා මෙසේ ද පැවසී ය.

" දැනට අප රටේ තිබෙන සෑම විරුද්ධ පක්ෂයක්ම ප්‍රජාතන්ත්‍ර වාදය හා පාර්ලිමේන්තුව ගරු නොකරන මාක්ස්වාදී පක්ෂයි. ඇත්තේ එක් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක් පමණකි. ආණ්ඩුවට විරුද්ධ ප්‍රජාතන්ත්‍රවාදී තවත් පක්ෂ විපක්ෂයේ නැති බව දන්නා රජය මහජන මතය අනුව හැඩ ගැසෙන්නට උත්සාහ ගන්නේ නැහැ. මේ නිසා උණු නිසා බොන්නත් බැහැ කැඳ නිසා අහක දාන්නත් බැරි තත්වයකටයි මහජනයා අද මුහුණ පා සිටින්නේ......."

1951 දී බණ්ඩාරනායක මහතා එක්සත් ජාතික පක්ෂයෙන් ඉල්ලා අස්වීම නිසා එතෙක් මාක්ස්වාදී පක්ෂ මෙහෙයවූ ප්‍රගතිශීලී ජනතා සටනට නව බලවේගයක් එක්වූයේ ය. එය ශ්‍රීලංකාවේ නව දේශ පාලන ගමනක ආරම්භයයි. 1956 පොදු ජනතා ජයග්‍රහණය එහි අවසන් ප්‍රතිඵලයයි. පොදු ජනතාව ඉලක්ක කර සමාජවාදී සමාජයක් නිර්මාණය කිරීමේ අපේක්ෂාව බණ්ඩාරනායක මහතා තුළ තිබුණේය. එතුමාගේ රජයෙන් කළ ජනසතු ව්‍යාපාර, සේවක අර්ථ සාධක අරමුදලක් පිහිටුවීම, බ්‍රිතාන්‍යය යටතේ තිබූ කටුනායක හා ත්‍රිකුණාමළය කඳවුරු පවරා ගැනීම ආදිය මෙන්ම, සිංහළ රාජ්‍යභාෂාව බවට පත්කර සිංහළ උගත් තරුණ පරපුර රාජ්‍ය පරිපාලනයේ කොටස්කරුවන් කර ගැන්ම කිසිදා අමතක කළ නොහැකිය. අපි එතුමන් අද දින කෘතවේදීව සිහිපත් කරන්නෙමු.

♦ **විස්කම් සෙනෙවිරත්න**
යක්කල **Sri Lanka**

# ලංකා පොලීසිය ගැන ජනතාව කළකිරේ

**ශ්‍රී** ලංකාවේ දවසින් දවස වැඩිවන පොලිස් මැරකම්, පහරදීම් හා වෙඩිතබා අහිංසකයින් ඝාතනය කිරීම් ආදිය නිසා මහජනතාව පොලීසිය ගැන දැඩි කලකිරීමට පත්ව සිටිති. තරුණියකට උසුළු විසුළු කිරීමේ වරදට ගිය මස පොලිස් අත් අඩංගුවට ගත් අඟුලානේ තරුණයන් දෙදෙනෙකු පොලීසියට ගෙනගොස් කූඩුවේ දමන ලදී. පසුදා ඒ තරුණයින්ගේ වෙඩි වැදුණු මළසිරුරු අඟුලානේ මුහුදු වෙරළේ තිබී හමුවී ඇත.

තොරතුරු තාක්ෂණය හදාරන ශිෂ්‍යයෙකුට පහරදීම සම්බන්ධයෙන් පොලීසියට එරෙහි තවත් විශාල පහරදීම් පුවතක් අසන්නට ලැබිණ. පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකක් අතර ඇතිවූ ගැටුමක් නිසා පහරලත් එක් ශිෂ්‍යයෙක් පොලිස් අධිකාරිවරයෙකුගේ පුතෙකි. ඔහු පොලිස් වාහනයකින් තවත් පොලිස් නිලධාරීන් ද කැටුව විරුද්ධ පිළේ සිසුවෙකු පැහැරගෙන ගෙදර රැගෙන ගොස් තම මවද සහභාගිකරවගෙන අර ශිෂ්‍යයාට සිහි නැතිවන තුරු දරුණු ලෙස පහර දී ඇත. ශ්‍රීලංකා නව සීලන්තය අතර සති දෙකකට පෙර කොළඹ පැවති ක්‍රිකට් තරඟය අවස්ථාවේ ගේට්ටුව ළඟ රැස්ව ඇතුල්වන්නට නොසන්සුන් වූ නරඹන්නන්ට ආරක්ෂාවටය කියා ගෙන්නා සිටි පොලිස් භටයන් ඉවක් බවක් නැතිව ඔළු පැලෙන තුරු බැටන් පොලුවලින් ප්‍රහාර එල්ලකර බව පුවත්පත්වල පළවිය. මේ කිසිවක් සම්බන්ධයෙන් පොලීසියට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග කිසිවක් ගෙන ඇති බවක්ද නොපෙනේ.



**ඉරිදා SUN** - තලවකැලේ නැන්දම්මා ඊයෙ ලියුමක් එවලා තිබුණා මාමගෙ අසනීපෙයක් ගැන කියලා. අපි ඒ ගැන දනං හිටියෙත් නැහැ. මාමට හෘදය වස්තුවට යන නලයක් අළුතින් බද්ධකළාලු.කොළඹ පුද්ගලික රෝහලක නමක් ලියලා තිබුණා. මට දැන් ඒක මතකනැහැ. නැන්ද කියනවා බිල ගෙවන්න ගිහිං ගාණ ඇහුවම නැන්දටත් පපුවෙ අමාරුව හැදුනයි කියලා. දවස් පහට රුපියල් ලක්ෂ 12 ද කොහෙද ගිහිං. සනීපවෙලා ලෙඩා ගෙදර ගියත් ඒ බිල ගෙවුවයින් පස්සෙ ඒ ගෙදර ඔක්කොම නිකම්ම ලෙඩ වෙනවයි, දුවේ ලංකාවට එනව නම් මෙහේදි ලෙඩ වෙන්න හිතන් නම් එන්න එපැයි කියලා නැන්ද ලියලා තිබුණා. ඔන්න ලංකාවෙ ඇත්ත තත්වෙ

**සඳුදා MON** - අද රන්ජනීලා අපේ ගෙදර ආවා. වෙම්බ්ලි පාක් වල ඇස්ඩා මාකට් එකට යන ගමන්. මරු කතාවක් කිව්වා. හෝම්බේස් එකේ මාස හතරකට ඉස්සෙල්ලා වට්ටක්ක ගෙඩි තරම් විසාල වෙන තක්කාලි ජාතියක් ගැන ප්‍රචාරය කරලා, ඒ පැල විකුණලා. ඒවට දාන්න විශේෂ පෝර වගයකුත් තිබුණලු. පවුම් 27 ක් දීලා රන්ජනී අරගෙන. කියපු විදියට තක්කාලි පැල ගෙදර පෝච්චියක හිටවලා, පෝර දාලා, සාත්තු කරලා මාස දෙකක් බලං හිටියලු. මං ඇහුවා ඉතින් වට්ටක්ක සයිස් තක්කාලි හැදුනද කියලා. රන්ජනී කිව්වා මොන පිස්සුද? අච්චර ගාණක් වියදම් කරලා වෙරළු ගෙඩි තරම් පුංචි තක්කාලි ගෙඩි දෙකක් ආවයි, ඒක හොද්දකටත් මදිය කියලා. කඩෙන් තක්කාලි රාත්තල් 20 ක් ගන්න තිබුණා ඒ වියදම්කරපු ගණනට. ගෑණු කොහොමත් අහුවෙනව.

**කුජදා TUE** - ලංකාවෙ යුද්ධ ඉවරවුණා විතරයි දැන් කවුරුවත් ඒ ගැන කතාකරන්නෙ නැහැ. පිටරට සිංහළ ඩයස් පෝරාවත් ඒ දවස්වල හුහක් දේවල් කරන්න ලැස්ති වුණා. සමහරු රණ විරුවන්ට අත් පා දෙන්න. ගෙවල් හදල දෙන්න. ඒ අයගෙ ළමයින්ට ඉගෙනගන්න වියදම් කරන්න. ලෝකෙ නැති දේවල් කරන්න ලැස්ති වුණා. යුද්ධෙ ඉවර වුණා විතරයි, දැන් කවුරුවත් ඒ ගැන කතාකරන්නෙ නෑ. ලංකාවෙත් ඒ වගේ බව පේනවා. රණවිරුවන්ට මල්තියලා උදේ හවස වඳින්න ඕනය කියලා ඒ කාලෙ පත්තරවල පළවුණා. ළඟදි පත්තරේක දැක්කා ආබාධිත රණවිරුවෙක් කිහිළිකරුවලින් බස් එකකට නැග්ගම කිසි කෙනෙක් නැගිටලා සීට් එකක් දීලා නෑ. කියනකොට එහෙමයි. කරනකොට මෙහෙමයි.

**බුදදා WED** - පින්නවල අලි අනාථාගාරෙ ඇත් පැටව් දෙන්නා දළදා මාළිගාවෙන් ඇවිත් පැහැරගෙන ගියාට පස්සෙ දැක්කා කවුද පත්තරේකට ලියලාඑවලා තිබුණා මෙහෙම. ලංකාවෙ ජනතාව බොහෝ අයට මෙසේ සිතේ. දළදා මාළිගාව හා පින්නවල අලි අනාථාගාරය ඒ තැන් මාරුකර ගතහොත් හොඳය. මාළිගාවට සම්බන්ධ අය දළදාවහන්සේ රකිනවාට වඩා අලි පස්සේ දුවන, අලි එකතුකරන කස්ටිය නිසා පින්නවල සිටින අලි ඇතුන් සියල්ලම මාලිගාවට භාරදිය යුතුය. දළදා වහන්සේ පින්නවලට වැඩමකළ යුතුය. පින්නවල ඉන්නා පිරිස සතුන්ට ආදරේ ඇති, කරුණාවන්ත, මෛත්‍රී සහගත පිරිසක් නිසා දළදා වහන්සේට වඩාත්ම සුදුසු තැන පින්නවලය. ඒ අය දළදා හාමුදුරුවන් හොඳින් මෙන්ම ඉතා භක්තියෙන් යුතුව රැකබලාගන්නවා ඇත.

**ගුරුදා THU** - ඉස්සර එංගලන්තෙ තිබ්බ්ච ගරු ගාම්භීරකම දැන් බිංදුවට බැහැලා. බීබීසී ප්‍රවෘත්ති කිව්වම ඉතාම ඇත්ත දේවල් හැටියට ලෝකෙම පිළිගත්තෙ. දැන් බීබීසී ප්‍රවෘත්ති කියන්නෙ පට්ටපල් බොරු. බාගයක් අතින් රෝල් කරපු අලි පව. මුළු ලෝකෙම දැන් බීබීසී කාරයින් විතර බොරු කියන ජාතියක් ලෝකෙ නෑ කියලා දන්නවා. මෙහේ චැනල් 4 නිව්ස් වලට පෙන්නුවා ළඟදි එල්ටීටීඊ කාරයො ඉස්සර හදාපු බොරු මගඩි විඩියෝ එකක්. සිංහළ යුද භටයො දෙමළ කීප දෙනෙකුට වෙඩි තියලා මරණවා. ඒක බලපු කාටත් තේරුණා නළුවො කීප දෙනෙක් දාලා කරන රඟපෑමක් කියලා.එහෙම යුද භටයො ලංකා හමුදාවෙ කවදාවත් හිටියෙ නෑ. උන් හමුදා ඇඳුම් ඇඳගත්තු කොටි නළුවො කීපදෙනෙක්. බොරුවක් බව හොඳටම දැනගෙන චැනල් 4 ඒක පෙන්නුවෙ ලංකාවට මඩගහන්න.

**කිවිදා FRI** - ලංකා පොලීසියෙ ඉතාම කරුණාවන්ත නිලධාරීනුත් ඉන්නබව කියන්න ඕන. දැන් රිටයර්වෙලා ඉන්න ඉන්ස්පැක්ටර් දිසානායක අයියා ඒ වගේ කෙනෙක්. අම්මලා ඒ කාලෙත් කිව්වෙ එයා පොලීසියට හොඳ වැඩිය කියලා. ඒත් දැන් ලංකාවෙ පොලීසිය ගන්න දෙයක් නෑ. සුද්දකරන්න බැරි තරමට කුණුවෙලා. ලොකු පර්යේෂණයක් කරන්න ඕන, පොලිස් ඉන්ටර්වීව් එකට යනකල් අගේට හිටි යහපත් මිනිස්සු පොලිස් යුනිපෝම් එක දා ගත්තු ගමන් නරුමෙයො වෙන්නෙ ඇයි කියලා. හාමුදුරු කෙනෙක් දවසක් බණට කිව්වා අවීචි නිරය ළඟම තව අපායක් තියනවයි, ඒකෙ නම පොලිස් අපාය කියලා. ඒ අපායෙ ලොක්කට ඉන්නෙ අර ඉස්සර හතර වෙනි තට්ටුවෙන් මිනිස්සු බිමට දාපු රාහුල සිල්වයි කියලත් කිව්වා. ඒ කතාව ඇත්තක් වෙන්න ඕන. නැත්නම් මේ හාදයො වෙන කොහේ යන්නද මැරුණම?